// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1931/20 - 2015 සැප්තැම්බර් මස 09 වැනි බදාදා - 2015.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඩබ්ලිව්ඊර්/එල්එන්ඩී/ඒකිව්යුඅයිආර්/44/(වීර/2014/33).
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/6/2014/එච්ඩබ්ලිව්/294.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, බැදිගම ගමේ, බැදිගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ සහ උතුරු ගිරුවා පත්තුව සුළු කොට්ඨාශයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2014.12.26 දිනැතිව පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 261 හි අතිරේක අංකය 56, පත්‍ර අංකය 56 පිඹුරේ කැබලි අංක 740 සිට 741 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5172 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (2):

01. කැබලි අංක 740
ඉඩමේ නම: රත්තගෙආරහේන, ගොන්හිටියාවලවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 1 - 3 ක් පමණ වයසැති පැළ පොල් ගස් 39 ක්, අවුරුදු 60 - 65 ක් පමණ වයසැති පොල් ගස් 57 ක් සහ තල් ගස් 04 ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ඩී. එස්. පී. ජගත්, අංක 385, මහවීදිය, අම්බලන්ගොඩ, (10එස් වැනි බිම් කැබැල්ලේ කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.4023.

02. කැබලි අංක 741
ඉඩමේ නම: රත්තගෙආරහේන, ගොන්හිටියාවලවත්ත; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ඩී. එස්. පී. ජගත්, අංක 385, මහවීදිය, අම්බලන්ගොඩ, (10එස් වැනි බිම් කැබැල්ලේ කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.1149.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2015.10.07 දින අනුව පෙරවරු 9.30 ට වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2015.09.30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සී. පී. ඩබ්ලිව්. වන්නිආරච්චි,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි
වීරකැටිය.

2015 සැප්තැම්බර් මස 08 වැනි දින

09 - 588

1A - G 22283 - 14 (2015/09)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.